මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone
மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்
මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I | 10 ශ්‍රේණිය | කාලය : පැය 01 යි |
|---|---|---|

**පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

විශ්ව විද්‍යාලයක ආපනශාලාවක් පවත්වාගෙන යන" නිසල් "කොවිඩ් 19 වෛරස ව්‍යාප්තිය පාලනය සඳහා විශ්ව විද්‍යාල වසා දැමීම හේතුවෙන් ද ඇඳිරි නීතිය නිසා ප්‍රදේශයේ වෙළෙඳ ව්‍යාපාර වසා තැබීම හේතුවෙන් ද අත්‍යවශ්‍ය සේවා අවසරපත්‍රයක් ලබාගෙන මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයට ගොස් තම ලොරියෙන් එළවළු ගෙනැවිත් අවට ප්‍රදේශවල නිවෙස්වලට බෙද හැරීම සිදුකරන ලදී.

1. මෙම සිද්ධියේ සඳහන් නිසල් විසින් සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාව කුමක්ද?
   1. ආහාර 2. එළවළු 3. ප්‍රවාහනය 4. ආරක්ෂාව

2. ඉහත සිද්ධියේ සඳහන් ව්‍යාපාරය කරගෙන යෑමට නිසල්ට ශක්තියක් වූයේ,
   1. කොවිඩ් 19 වෛරසය ව්‍යාප්ත වීමය.
   2. ඔහු සතුව ලොරි රථයක් තිබීමය
   3. විශ්ව විද්‍යාල වසා දැමීමය.
   4. අත්‍යවශ්‍ය සේවා අවසර පත්‍රයක් ලබා ගැනීමය

3. නිරෝධායන ඇඳිරිනීතිය පැනවීම හා අත්‍යවශ්‍ය සේවා බෙද හැරීම සඳහා අවසර පත්‍රයක් ලබාදීම අදළ වන ව්‍යාපාර පරිසරය වන්නේ,
   1. දේශපාලන පරිසරය 2. නෛතික පරිසරය
   3. ආර්ථික පරිසරය 4. ගෝලීය පරිසරය

4. නිසල් විශ්ව විද්‍යාල ආපනශාලාව වසා තැබීමෙන් සිදුවූ පාඩුවද දරාගනිමින් ,පවත්නා අවස්ථාවෙන් ප්‍රයෝජන ගනිමින් එළවළු මිලට ගෙන බෙදහැරීම අයත්වන නිෂ්පාදන සාධකය වන්නේ,
   1. භූමිය 2. ශ්‍රමය 3. ප්‍රාග්ධනය 4. ව්‍යවසාය

5. මෙම සිද්ධියේ සඳහන් නිසල්ගේ එළවළු ව්‍යාපාරය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   1. මෙය භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි
   2. මෙය සේවා සැපයීමේ ව්‍යාපාරයකි
   3. මෙය විශ්ව විද්‍යාල සිසුන්ට ආහාර සපයන ව්‍යාපාරයකි
   4. අසල්වැසියන්ට ආහාර සැපයීමේ සමාජ සුභසාධන අරමුණින් කරන ව්‍යාපාරයකි

6. වර්තමානයේ විද්‍යුත් මාධ්‍ය මගින් බොහෝ ව්‍යාපාර කටයුතු ඉක්මනින් හා පහසුවෙන් කර ගැනීමට හැකිවී ඇත . එසේ ඉටුකරලිය නොහැකි කටයුත්තක් වන්නේ,

   1. සියලු මිනිස් අවශ්‍යතා ඉටුකරදීම
   2. භාණ්ඩ ඇණවුම් කිරීම
   3. මුදල් ගෙවීම
   4. ප්‍රචාරණය

7. අද මුළු ලෝකයම විශ්ව ගම්මානයක් බවට පත්වී ඇතැයි කියවේ. ලෝකය විශ්ව ගම්මානයක් වීමට වඩාත්ම බලපා ඇත්තේ,

   1. ලෝකය දේශ සීමා හා ආර්ථික සම්බාධකවලින් තොරවීමයි.
   2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ දියුණුවයි
   3 . ලොව සෑම පුද්ගලයෙක්ම විවි රටවල නිපදවන භාණ්ඩ පරිභෝජනය කිරීමයි
   4. ලොව බොහෝ පුද්ගලයන් වෙනත් රටවල රැකියා කිරීමයි.

8. ව්‍යාපාරයක් විසින් වෙළෙඳපොළ සඳහා භාණ්ඩ නිෂ්පාදනය කිරීමේදී සලකාබලන කරුණු වන්නේ,

   1. ජීවන රටාව, අවශ්‍යතා හා වුවමනා, ආදායම් මට්ටම
   2. පාරිභෝගික රුචිකත්වය, ජනගහනය,සමාජ තත්වය
   3. ජනගහනය, ආදායම් මට්ටම, සමාජ තත්වය
   4. පාරිභෝගික රුචිකත්වය, ආදායම් මටටම, සමාජ තත්වය

9. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර සාධක පමණක් ඇතුළත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.

   1. ගනුදෙනුකරුවෝ, සැපයුම්කරුවෝ, තරගකරුවෝ
   2. ගනුදෙනුකරුවෝ, කළමනාකරුවෝ, සේවකයෝ
   3. අයිතිකරුවෝ , කළමනාකරුවෝ, සේවකයෝ
   4. අයිතිකරුවෝ, කළමනාකරුවෝ, සේවකයෝ

10. ව්‍යාපාරයක . . . . . . . . .(1) . . . . . . . . .අඛණ්ඩව ඇණවුම් ලබා ගැනීමට උනන්දුවක් දක්වන අතර . . . . . . .(2)...................... තවදුරටත් ණය සැපයීම සඳහා උනන්දු වෙති.

   1. සැපයුම්කරුවෝ , මූල්‍ය ආයතන　　　2. අයිතිකරුවෝ , කළමනාකරුවෝ
   3. සේවකයෝ, ගනුදෙනුකරුවෝ　　　4. තරගකරුවෝ, මූල්‍ය ආයතන

11. දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන හිතකර බලපෑමක් නොවන්නේ,

   1. නවීන තාක්ෂණය ලබාගත හැකිවීම
   2. විදේශීය ප්‍රාග්ධනය රටතුළට ගලා ඒම
   3. ගුණාත්මක විදේශීය අමුද්‍රව්‍ය ලබාගත හැකිවීම
   4. දේශීය පුහුණු ශ්‍රමය විදේශ රටවලට ඇදී යාම

12. පහත සඳහන් වන්නේ ව්‍යාපාර සංවිධානවල ලක්ෂණයන්ය.

A අඛණ්ඩ පැවැත්මක් තිබීම
B වගකීම සීමාසහිත වීම
C නෛතික පුද්ගලභාවයක් හිමි නොවීම
D කොටස් නිකුත්කර ප්‍රාග්ධනය රැස්කර ගත හැකිවීම
E ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පැවතීම

මේ අතරින් සංස්ථාපිත සමාගම්වලට පමණක් අදාළ වන ලක්ෂණ ඇතුළත් පිළිතුර වන්නේ

1. ABC 2. BCD 3.ABD 4. CDE

13. 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව අවම පුද්ගලයන් දෙදෙනෙක් හා උපරිම විස්සකින් යුතුව ආරම්භ කළ හැකි ව්‍යාපාර සංවිධානය වන්නේ,

1. හවුල් ව්‍යාපාරය 2. සංස්ථාපිත සමාගම්ය
3. සමුපකාර සමිතිය 4. රාජ්‍ය සංස්ථාය.

14. ව්‍යාපාර කටයුතු තුළින් උපයනු ලබන අතිරික්තය හෙවත් ආර්ථික ප්‍රතිලාභ සාමාජිකයන් අතරේ බෙදීම දක්නට ලැබෙන ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,

1. හවුල් ව්‍යාපාර 2. සංස්ථාපිත සමාගම්
3. සමුපකාර සමිති 4. රාජ්‍ය දෙපාර්තමේන්තු

15. අත්‍යවශ්‍ය සේවා සැපයීම සඳහා යෝග්‍යතම ව්‍යාපාර සංවිධාන වරගයකි.

1. තනි පුද්ගල ව්‍යාපාර 2. හවුල් ව්‍යාපාර
3. සංස්ථාපිත සමාගම් 4. රාජ්‍ය සංස්ථා

16. පුද්ගලයෙකුට තම ව්‍යාපාරයේ අයිතිය තහවුරු කර ගැනීමට හා අනන්‍යතාවක් ලබා ගැනීමට කළ යුත්තේ,

1. ව්‍යාපාරය ඉදිරියෙන් නාම පුවරුවක් සවිකිරීමය
2 .ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමය
3. ව්‍යාපාරයේ නම ප්‍රචාරණය කිරීමය
4. වැඩි ප්‍රාග්ධනයක් යොදා ව්‍යාපාරය පුළුල් කිරීමය

17. ගිණුම්කරණයේ මූලික අරමුණ ලෙස සලකන්නේ ,

1 .ව්‍යාපාරයේ මූල්‍ය තත්වය දැන ගැනීම
2. ව්‍යාපාරය උපයා ඇති ලාභය දැනගැනීම
3. නීතිමය අවශ්‍යතා ඉටුකිරීමට
4. ව්‍යාපාරය කෙරෙහි ඇල්මැති පාර්ශව වලට ප්‍රයෝජනවත් තොරතුරු සැපයීම

18. ලක්මාල්ගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි 01 දින ගිණුම්කරණ සමීකරණයේ පැවති අගයන් පහත දැකවේ.

වත්කම් (රු) = හිමිකම් (රු)+ වගකීම් (රු)

500000 = 400000 + 100000

2020 ජනවාරි 2 දින රු. 50000 ක බඩුතොග ණයට ගැනීමෙන් සහ රු. 10000 ක බැංකුණයක් ආපසු ගෙවීමෙන් පසු ගිණුම්කරණ සමීකරණයේ අගය වන්නේ,

වත්කම් (රු) = හිමිකම් (රු) + වගකිම් (රු)

1. 550000 = 400000 + 150000
2. 500000 = 400000 + 100000
3. 540000 = 390000 + 150000
4. 540000 = 400000 + 140000

19. පහත සඳහන් ගනුදෙනු අතරින් හිමිකම වැඩිවීමට බලපාන ගනුදෙනුව තෝරන්න.

1. අයිතිකරු ව්‍යාපාරයේ මුදලින් රු. 10000 ක් පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම
2. අයිතිකරුගේ පෞද්ගලික මුදලින් ව්‍යාපාරයේ රු.10000 ක බැංකු ණය ගෙවීම
3. රු. 10000 ක් වැටුප් ගෙවීම
4. අත්පිට මුදලට රු. 10000 ක බඩු තොගයක් මිලට ගැනීම

20. ගනුදෙනුවකට අදාළ ද්විත්ව සටහන පහත දැක්වේ.

ණය හිමි ගිණුම හර 10000

මුදල් ගිණුම බැර 10000

ඉහත ද්විත්ව සටහනට අදාළව සිදුවූ ගනුදෙනුව කුමක්දැයි තෝරන්න.

1. රු. 10000 ක බැංකු ණය ගෙවීම
2. රු. 10000 ක භාණ්ඩ අත්පිට මුදලට ගැනිම
3. ණය හිමියෙකුට රු. 10000 ක් ගෙවීම
4. රු. 10000 ක භාණ්ඩ ණයට ගැනීම

21. ව්‍යාපාරයක . . . . . . . .1. . . . . . . . . නිසා හිමිකමෙහි සිදුවන අඩුවීම හැරුණු විට හිමිකමෙහි සිදුවන අඩුවීම් . . . . . .(2)...................... ලෙස හැඳින්වේ.

1. ගැනිලි , වියදම් 2. ආදායම් , වියදම්
3. ගැනිලි, ප්‍රාග්ධනය 4. වත්කම්, වගකීම්

22. ව්‍යාපාරයක 2020.1.1 දිනට ගිණුම්කරණ සමීකරණය පහත දැක්වේ.

වත්කම් (රු) = හිමිකම් (රු)+ වගකීම් (රු)

500000 = 400000 + 100000

2020.1. 2 දින සිදුවූ ගනුදෙනුවක් නිසා සමීකරණය පහත පරිදි වෙනස් විය.

වත්කම් (රු) = හිමිකම් (රු)+ වගකීම් (රු)

490000 = 390000 + 100000

2020.1.2 දින සිදුවූ ගනුදෙනුව විය හැක්කේ,

1. රු. 10000 ක භාණ්ඩ අත්පිට මුදලට ගැනීමය
2. රු. 10000 ක ගෙවල් කුලී ආදායම් ලැබීමය
3. රු. 10000 ක බැංකු ණය වාරික ගෙවීමය
4. රු. 10000 ක භාණ්ඩ අයිතිකරු තම පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීමය.

23. සජිත්ගේ ව්‍යාපාරයේ 2019.1.1 දිනට හිමිකම රු. 225000 කි. 2019 වර්ෂය තුළ රු. 75000 ක අමතර ප්‍රාග්ධනයක් යොදා ඇති අතර වර්ෂයේ වියදම රු. 30000 ක් හා ආදායම රු. 70000 වේ. 2019.12.31 දිනට සජිත්ගේ ව්‍යාපාරයේ හිමිකම කොපමණද?

1. රු. 225000 2. රු. 300000 3. රු. 340000 4. රු. 400000

- පහත සඳහන් තොරතුරු උපයෝගී කරගනිමින් ප්‍රශ්න අංක 24-27 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

2020 ජනවාරි මාසයේ දීප්තිකාගේ ව්‍යාපාරයේ පහත ගනුදෙනු සිදුවිය.

A- රු. 5000 ක රක්ෂණ ගාස්තු ගෙවීම

B- අත්පිට මුදලට රු. 7000ක භාණ්ඩ විකිණීම

C- රු. 2000 ක දුරකථන ගාස්තු චෙක්පතකින් ගෙවීම

D- රු. 50000 ක යන්ත්‍ර උපකරණ මිලට ගැනීම

24. A ගනුදෙනුව නිසා මූලික ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම වන්නේ,

1. වත්කම් වැඩිවීම , හිමිකම් අඩුවීම
2. වත්කම් අඩුවීම , හිමිකම් අඩුවීම
3. වත්කම් අඩුවීම , වගකීම් වැඩිවීම
4. වත්කම් වැඩිවීම , වගකීම් අඩුවීම

25. B ගනුදෙනුව සටහන් කිරීමට උපයෝගී කරගන්නා මූලාශ්‍ර ලේඛනය වන්නේ,

1. ලදුපත 2. ගෙවීම් වවුචරය 3. ගැනුම් ඉන්වොයිසිය 4. ජර්නල් වවුචරය

26. C ගනුදෙනුව සටහන් කරනු ලබන මුලික සටහන් පොත වන්නේ,

1. මුදල් පොත 2. බැංකු ගිණුම 3.ගැනුම් ජර්නලය 4. විකුණුම් ජර්නලය

27. D ගනුදෙනුවට අදළ නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

1. මුදල් පොත හර 50000 යන්ත්‍ර උපකරණ ගිණුම බැර 50000
2. යන්ත්‍ර උපකරණ ගිණුම හර 50000 ණය හිමි ගිණුම බැර 50000
3. ගැනුම් ගිණුම හර 50000 මුදල් පොත බැර 50000
4. යන්ත්‍ර උපකරණ ගිණුම හර 50000 මුදල් පොත බැර 50000

28. රු. 200000 ක් වටිනා මෝටර් රථයක් අත්පිට මුදලට ගැනීම නිසා ව්‍යාපාරයක,

1. වත්කම් රු. 200000 කින් අඩුවී, හිමිකම රු 200000 කින් අඩුවේ
2. වත්කම් රු. 200000 කින් වැඩිවී, වගකීම් රු. 200000 කින් වැඩිවේ
3. වත්කම් රු. 200000 කින් අඩුවී, වත්කම් රු. 200000 කින් වැඩිවේ
4. හිමිකම රු. 200000 කින් වැඩිවී ,වගකීම් රු. 200000 කින් අඩුවේ

29. කිසියම් ව්‍යාපාරයකට අයත් වත්කම් සියල්ල එහි අයිතිකරු විසින් සපයා ඇති විටක නිවැරදි ගිණුම්කරණ සමීකරණය වන්නේ,

1. වත්කම් = හිමිකම
2. වත්කම් = හිමිකම + වගකීම්
3. හිමිකම = වත්කම් - වගකිම්
4. හිමිකම = වත්කම් + වගකීම්

30. ව්‍යාපාරයක අයිතිකරු රු. 50000 ක අතිරේක ප්‍රාග්ධනයක් යෙදවීම සටහන් කිරීමට අදළ මූලාශ්‍ර ලේඛනය හා මූලික සටහන් පොත පිළිවෙලින්,

1. ලදුපත හා මුදල් පොතයි
2. ජර්නල් වවුචරය හා පොදු ජර්නලයයි
3. මුදල්පොත හා ලදුපතයි
4. ලදුපත හා ප්‍රාග්ධන ගිණුමයි

31. වැඩිවීම බැර , අඩුවීම හර යන ද්විත්ව සටහන් මූලධර්මයට අදළ නිවැරදි ගිණුම් දැක්වෙන පිළිතුර තෝරන්න

1. වත්කම් ගිණුම් හා වියදම් ගිණුම්
2. ආදයම් ගිණුම් හා වියදම් ගිණුම්
3. වත්කම් ගිණුම් හා වගකීම් ගිණුම්
4. වගකීම් ගිණුම් හා හිමිකම් ගිණුම්

32. වගකීමක ලක්ෂණයක් නොවන්නේ,

1. අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් වීම
2. වර්තමාන බැදීමක් තිබීම
3. අනාගතයේදී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම
4. බේරුම් කිරීමේදී ව්‍යාපාරයේ සම්පත් වලින් කොටසක් පිටතට ගලායාම

33. රු. 25000 ක් පිරිවැය වූ භාණ්ඩ තොගයක් රු. 30000 කට අත්පිට මුදලට විකුණන ලදි. මෙම ගනුදෙනුව නිසා ගිණුම්කරණ සමීකරණයේ හිමිකමට වන බලපෑම වන්නේ,

1. රු. 5000 කින් හිමිකම වැඩිවීමයි
2. රු. 25000 කින් හිමිකම වැඩිවීමයි
3. රු. 30000 කින් හිමිකම වැඩිවීමයි
4. රු. 5000 කින් හිමිකම අඩුවීමයි

34. ගනුදෙනුවක් සටහන් කිරීමට අදළ ද්විත්ව සටහනක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| ණය හිමි ගිණුම | හර | රු. 5000 |
| මුදල් පොත | බැර | රු. 5000 |

සිදුවී ඇති ගනුදෙනුව වන්නේ,

1. රු. 5000 ක් වටිනා බඩුතොගයක් ණයට ගැනීමය
2. රු. 5000 ක් ණය හිමියන්ට මුදල් ගෙවීමය
3. ණය හිමියන්ගෙන් රු. 5000 ක් වට්ටම් ලැබීමය
4. රු. 5000 ක මුදලක් ණයට ගැනීමය

35. ව්‍යාපාරයක සිදුවන සෑම ගනුදෙනුවක්ම ප්‍රථමයෙන් සටහන් කරනු ලබන්නේ,

1.ලෙජරයේය  2. මූලික සටහන් පොත්වලය

3. මුදල් පොතේය  4. මූල්‍ය වාර්තාවලය

36. රවිදුගේ ව්‍යාපාරයේ 2020.01.01 දිනට හිමිකම රු. 200000 ක් වූ අතර 2020.01.05 දිනට හිමිකම රු. 220000ක් විය. මෙම කාලය තුළ ව්‍යාපාරයේ එක් ගනුදෙනුවක් පමණක් සිදුවූයේ නම් , එම ගනුදෙනුව වන්නේ.

1. රු. 220000 ක් ප්‍රාග්ධනය යෙදීමය
2. අයිතිකරු විසින් රු. 20000 ක භාණ්ඩ පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීමය
3. පිරිවැය රු. 60000 ක් වූ තොගයක් රු. 40000 කට ණයට විකිණීමය
4. පිරිවැය රු. 40000 ක් වූ තොගයක් රු. 60000 කට අත්පිට මුදලට විකිණීමය

37. පහත දක්වා ඇති ගනුදෙනු අතරින් වත්කම් , හිමිකම් හා වගකීම් යන සියල්ලටම බලපෑමක් ඇති කරන ගනුදෙනුව තෝරන්න

1. අයිතිකරු රු. 2000 ක මුදලක් පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීමය
2. ණය ගැතියන්ගෙන් රු. 5000 ක මුදලක් ලැබීමය
3. රු. 5000 ක පොලිය ඇතුළුව රු. 50000 ක් බැංකු ණය ආපසු ගෙවීමය
4. ණය හිමියන්ට රු. 10000 ක මුදලක් ගෙවා දැමීමය

38. මහේන්ද්‍ර විසින් රු. 20000 ක් පිරිවැය වූ බඩු තොගයක් ණයට ගන්නා ලදී . එහිදී අඩුකළ වෙළෙඳ වට්ටම 10% කි. මුදල් ගෙවීමේදී 10% ක මුදල් වට්ටමක් ද හිමිවිය. මහේන්ද්‍රගේ පොත්වල සටහන් කරන වට්ටම් ප්‍රමාණය වන්නේ,

1. රු. 1000  2. රු.1800  3. රු. 2000  4. රු. 3800

- පහත සඳහන් තොරතුරු ඇසුරෙන් අංක 39 හා 40 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

තිසරගේ ව්‍යාපාරයේ 2019.12.31 දින සුළු මුදල් භාරකරු ළඟ ඉතිරි මුදලරු. 1200 කි. 2019 දෙසැම්බර් මාසයේ සුළු මුදල් විශ්ලේෂණ තීරුවල පහත ශේෂ දක්නට ලැබුණි.

| | |
|---|---|
| ලිපිද්‍රව්‍ය | රු 1200 |
| ගමන් ගාස්තු | 1300 |
| සංග්‍රහ වියදම් | 1800 |
| විවිධ වියදම් | 1500 |

තිසර 2020.01.01 දින සිට සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම රු. 10000 දක්වා වැඩිකිරීමට තීරණය කරන ලදී .

39. මෙම ව්‍යාපාරයේ 2019 දෙසැම්බර් මාසයේ සුළුමුදල් වියදම් වල වටිනාකම

1. රු. 1200 කි  2. රු. 4800 කි  3. රු. 5800 කි  4. රු.7000 කි

40. 2020.01.01 දිනට සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කළ යුතු වටිනාකම වන්නේ,

1. රු. 4200  2. රු. 5800  3. රු. 8800  4. රු.10000

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone
மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்
මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| වයාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II | 10 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

- පළමු ප්‍රශ්නය ඇතුලුව I කොටසෙන් ප්‍රශ්න 2ක් ද II කොටසෙන් ප්‍රශ්න 2ක් ද ඇතුලුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

1. පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කාර්මික විද්‍යාලයක පෑස්සුම් ශිල්පී පුහුණු පාඨමාලාවක් හදරා රැකියාවක් සොයමින් සිටි කසුන්, කොවිඩ් 19 වෛරස් ව්‍යාප්තිය පාලනය සඳහා පාසල් විවෘත කිරීමට පෙර පාසල් ගේට්ටුව අසල අත සෝදන බේසම් සවිකිරීමට අදාළ බලධාරින් නියම කිරීම හේතුවෙන් "හයිකෙයා ස්ටීල් "නමින් පාදයෙන් ක්‍රියාත්මක අතසෝදන බේසම් හා වෙනත් වානේ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ආයතනයක් 2020.06.01 දින තම නිවසේ කොටසක ආරම්භ කරන ලදී .

කසුන් කුඩා කල සිට ඔහුගේ පියා කසුන්ගේ නමින් ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කර තිබූ රු. 250000 ක මුදලද රජයේ සහන පොළී පදනම මත 10% පොලියට බැංකුවෙන් ලබාගත් රු.100000 ක ණය මුදලද ඔහු මේ සඳහා යොදවන ලදී .
2020 ජුනි මාසය තුළ ඔහුගේ ව්‍යාපාරයේ පහත ගනුදෙනු සිදුවිය.

2020.06.02 ඔහු රු. 150000 ක් වැයකර පෑස්සුම් උපකරණ මිලදී ගන්නා ලදී .

2020.06.03 පෑස්සුම් කටයුතු සඳහා අවශ්‍ය රු. 100000 ක වානේ කම්බි හා අනෙකුත් අමුද්‍රව්‍ය මිලට ගැනීම

2020.06.05 පෑස්සුම් කටයුතු සඳහා අවශ්‍ය රු. 100000 ක අමුද්‍රව්‍ය සුපීරියර් හාඩ්වෙයාර් වෙතින් ණයට ගැනීම

2020.06.10 ප්‍රාචාරණ වියදම් ගෙවීම රු. 10000

2020.06.20 විදුලි වියදම් ගෙවීම රු. 5000

2020.06.26 ප්‍රදේශයේ පාසල් හා වෙනත් ආයතන වලට එකක් රු. 3000 බැගින් බේසම් 100 ක් විකිණීම

2020.06.28 සුපීරියර් හාඩ්වෙයාර් වෙත රු. 80000 ක් මුදල් ගෙවීම

2020.06.30 බැංකු ණය මුදලෙන් කොටසක් ගෙව්වා රු. 10000

(i) (අ) "හයිකෙයා ස්ටීල් " ව්‍යාපාරය මගින් පාසල් වලට අතසෝදන බේසම් සැපයීම මගින් සපුරාලන මිනිස් අවශ්‍යතාව කුමක්ද?
(ආ) වර්තමානයේ ඒ ආශ්‍රිතව මතුවී ඇති වුවමනාව කුමක්ද?

(ii) " හයිකෙයා ස්ටීල් " ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතු බව කසුන්ගේ පියා පවසයි.
(අ) ඔබ එම ප්‍රකාශය හා එකග වන්නේද?
(ආ) ඉහත(අ) හි ඔබ සඳහන් කළ පිළිතුරට හේතුව සඳහන් දක්වන්න.

(iii) "හයිකෙයා ස්ටීල් " ව්‍යාපාරය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය අයිතිය හා අරමුණ අනුව නම් කරන්න

(iv) (අ)මෙම ව්‍යාපාරය සම්බන්ධයෙන් කසුන් සතු ශක්තීන් දෙකක් නම් කරන්න
(ආ) මෙම ව්‍යාපාරය හා සම්බන්ධ ව්‍යාපාර අවස්ථාවක් නම් කරන්න

(v) 2020.06.01 දින මෙම ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය වටිනාකම් සහිතව ලියන්න

(vi) ඉහත ව්‍යාපාරයේ විදුලි බිල ගෙවීමට අදාළ ද්විත්ව සටහන ලියන්න

(vii) ඉහත ව්‍යාපාරයේ ගනුදෙනු සටහන් කිරීම සඳහා භාවිතා කෙරෙන මූලික සටහන් පොත් දෙකක් හා මූලාශ්‍ර ලේඛන දෙකක් ලියන්න

(viii) "හයිකෙයා ස්ටීල්" ව්‍යාපාරයේ මුදල් පොත පිළියෙල කර 2020.06.30 දිනට කසුන්ගේ අත ඉතිරි මුදල සොයන්න

(ix) 2020.06.30 දිනට හයිකෙයා ස්ටීල් ව්‍යාපාරයේ වත්කම් දෙකක් වටිනාකම් සහිතව ලියන්න

(x) 2020.06.30 දිනට එම ව්‍යාපාරයේ වගකීම්වල වටිනාකම කොපමණද?

(ලකුණු 2 × 10=20යි)

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න)

2. (1) (අ) මිනිස් වුවමනාවක් යනු කුමක්ද?

(ආ) මිනිස් වුවමනාවක ලක්ෂණ දෙකක් ලියන්න ( ලකුණු 02 යි)

(11) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය දයන්න දක්වන්න

(අ) ව්‍යාපාරයක් යනු ලාභ ඉපයීමේ අරමුණින් පවත්වාගෙන යන ආර්ථික කටයුත්තකි.

(ආ)ව්‍යාපාරිකයනට අවශ්‍යතා නිර්මාණය කළහැකි අතර වුවමනා නිර්මාණය කළ නොහැක.

(ඉ) ස්වභාව ධර්මයෙන් ලැබී ඇති සියලු සම්පත් භූමිය යනුවෙන් හැඳින්වේ.

(ඊ) ව්‍යාපාරයකට සම්පත් සපයන පුද්ගලයන් එහි අයිතිකරුවන් වේ. (ලකණු 02 යි)

(111) නන්දනී අසල්වැසි තම මිතුරියක වන රමණීගේ ද සහය ඇතිව සහල් පිටිවලින් නිෂ්පාදිත කෙටි කෑම සකස් කර පාසල් ආපනශාලා වලට හා නගරයේ හෝටල් වලට අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.

(අ) නන්දනීගේ ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශව වන සේවකයන් හා ගනුදෙනුකරුවන් සඳහා සිද්ධියේ ඇතුළත් නිදසුන බැගින් ලියන්න.

(ආ) ඉහත (අ) හි ඔබ සඳහන් කළ ඇල්මැති පාර්ශවය නන්දනීගේ ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දැක්වීමට හේතුව බැගින් ලියන්න. (ලකුණු 02 යි)

(IV) ව්‍යාපාරයක ඇල්මැති පාර්ශව වන අයිතිකරුවන් හා සැපයුම්කරුවන් වෙතින් ව්‍යාපාරය බලාපොරොත්තු වන දයකත්වයන් දෙක බැගින් සඳහන් කරන්න.

(ලකුණ 02 යි)

(මුළු ලකුණු 08 යි)

3. (I) (අ) "ව්‍යාපාර පරිසරය" හඳුන්වන්න

(ආ)අභ්‍යන්තර පරිසර සාධක දෙකක් හා බාහිර පරිසර සාධක දෙකක් නම් කරන්න

(ලකුණු 02යි)

(II) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න

(අ) අධිවේගී මාර්ග ඉදිකිරීම ව්‍යාපාර අවස්ථාවක් වේ

(ආ) ව්‍යාපාරයක ගනුදෙනුකරුවන් අභ්‍යන්තර පරිසරයට අයත් වේ

(ඉ) පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා පමණක් පනවන නීතිරීති නෛතික පරිසරයට අයත්වේ

(ඊ) උද්ධමනය හා පොළී අනුපාතය " ආර්ථික පරිසරය" ට අදළ සාධකයන්ය

(ලකුණු 02 යි)

(III) 2020 මාර්තු - අප්‍රේල් මාසවල කොවිඩ් 19 වෛරසය ලෝකයේ රටවල් හා ස්වයං පාලන ප්‍රදේශ 213 ක පැතිරීම නිසා ලොව බොහෝ රටවල් ගුවන් ගමන් නවතා තිබුණි.

(අ) ඉහත ප්‍රකාශයෙන් ගම්‍ය වන ව්‍යාපාර පරිසර සාධකය කුමක්ද?
(ආ) කොවිඩ් 19 වෛරස ව්‍යාප්තිය නිසා දේශීය ව්‍යාපාරවලට සිදුවූ අහිතකර බලපෑම් දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 02 යි)

(iv) ව්‍යාපාරිකයෙකුට ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය හා බාහිර පරිසරය අධ්‍යයනය කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 08 යි)

4 (I) (අ) ව්‍යාපාර සංවිධානයක් යනු කුමක්ද?
(ආ) ව්‍යාපාර සංවිධාන වර්ග කළ හැකි නිර්ණායක තුන නම් කරන්න

(ලකුණු 02 යි)

(11 ) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න

(අ) සංස්ථාපිත සමාගමක කොටස් කරුවන්ගේ වගකීම අසීමිතයි

(ආ) ප්‍රජාතන්ත්‍රවාදි පාලනයක් පැවතීම සමුපකාර සමිතියක වාසියකි

(ඉ) රාජ්‍ය දෙපාර්තමේන්තු සඳහා අවශ්‍ය අරමුදල් රජයේ වාර්ෂික අයවැය ලේඛනය මගින් වෙන් කරයි

(ඊ) ඒක පුද්ගල ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ බලධරයා වනුයේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාය

(ලකුණු 02යි)

(111) නිරෝධායන ඇදිරිනීතිය සමයේදී මතුගම ප්‍රාදේශීය සභාව, සතොස සමග එක්ව සහන මිලට හාල් පරිප්පු ඇතුළු ආහාර මල්ලක් නිවෙස්වලට ගොස් අලෙවිකරන ලදී

(අ) හිමිකාරිත්වය අනුව වර්ග කිරීමේදී ප්‍රාදේශීය සභාව අයත්වන්නේ කුමන අංශයටද?

(ආ) අරමුණ අනුව වර්ග කිරීමේදී සතොස අයත් වන්නේ කුමන ව්‍යාපාර වර්ගයටද?

(ලකුණු 02 යි)

(IV) පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන රවිදු, තම මිතුරෙකු වූ චමෝද් සම්බන්ධ කරගෙන තම ව්‍යාපාරය හවුල් ව්‍යාපාරය් ලෙස පවත්වාගෙන යාමට අදහස් කරයි

රවිදුගේ ඉහත තීරණයට පක්ෂව හා විපක්ෂව කරුණු දෙක බැගින් සඳහන් කරන්න

(ලකුණු 02 යි)

(මුළු ලකුණු 08 යි)

## II කොටස - ගිණුම්කරණය

5. (I) (අ) " වියදම්" යන්න හඳුන්වන්න

(ආ) ව්‍යාපාරයක වියදම් වර්ග දෙකක් නම් කරන්න (ලකුණු 02යි)

(II) පහත සඳහන් ගනුදෙනු සඳහා ද්විත්ව සටහන් ලියන්න

(අ) ණය ගැති සමරකෝන්ගෙන් රු.5000 ක් මුදල් ලැබීම

(ආ) ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 1500000 ක් වටිනා ලොරිරථයක් උදය මෝටර්ස් වෙතින් ණයට ගැනීම (ලකුණු 04 යි)

(III) තිසුර පාසල් උපකරණ අලෙවිකිරීමේ ව්‍යාපාරයක් 2020.01.01 දින අරඹන ලදී . එදින සිදුවූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

1. තිසුර ව්‍යාපාරයට මුදල් යෙදවීම රු. 100000
2. ලී බඩු අත්පිට මුදලට ගැනීම රු. 25000
3. බැංකු ණයක් ලබා ගැනීම රු. 50000
4. පාසල් උපකරණ ණයට ලබා ගැනීම රු. 20000
5. කඩකුලී ගෙවීම රු. 10000
6. ණයට විකුණුම් රු. 3000

ඉහත එක් එක් ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න

(ලකුණු 06යි)

(මුළු ලකුණු 12 යි)

6. (I) (අ) ලෙජරය යනු කුමක්ද?
(ආ) ලෙජරයක ඇති ගිණුම්වර්ග නම් කරන්න (ලකුණු 02යි)

(II) 2020 පෙබරවාරි මාසය තුළ කුමුදුගේ ව්‍යාපාරයේ පහත ගනුදෙනු සිදු වී ඇත .

2.1 ප්‍රාග්ධනය යෙදුවා රු.200000
2.2 රු. 100000 ක බැංකු ණයක් ලබා ගැනීම
2.5 රු. 50000 ක බඩු තොග මුදලට ගැනීම
2.7 රු. 40000 ක බඩුතොග නුවන්ගෙන් ණයට ගැනීම
2.10 කඩකුලී රු. 8000 ක් ගෙවීම
2. 15 රු. 20000 ක බඩුතොග මුදලට විකිණීම
2.20 රු. 10000 ක බඩුතොග සුපුන්ට ණයට විකිණීම
2.22 නුවන්ට රු. 20000 ක් මුදල් ගෙවීම
2.26 සුපුන්ගෙන් රු. 10000 ක් ලැබීම
2.30 රු. 20000 ක බැංකු ණය ආපසු ගෙවීම

ඉහත ගනුදෙනු ලෙජර් ගිණුම්වල සටහන් කර ගිණුම් තුලනය කරන්න (ලකුණු 10)

(මුළු ලකුණු 12යි)

7. (I) (අ) මූලාශ්‍ර ලේඛන යනු කුමක්ද?

(ආ) මූලාශ්‍ර ලේඛනවල අන්තර්ගත, අදාළ මූලික සටහන් පොත්වල සටහන් කරන අයිතම හතරක් ලියන්න. (ලකුණු 02යි)

(11) සුසිත්ගේ ව්‍යාපාරයේ 2020.06.01 දිනට පහත දැක්වෙන ශේෂයන් පැවතුනි.

| | | |
|---|---|---|
| ණය ගැති ශේෂ - | බුද්ධික | රු. 50000 |
| | රන්දික | රු. 40000 |
| ණය හිමි ශේෂ - | මිතුන් | රු. 55000 |
| | සිතුම් | රු. 35000 |
| මුදල් ශේෂය | | රු. 60000 |

ජූනි මාසයේ පහත සඳහන් ගනුදෙනු සිදුවිය.

6.5 බුද්ධිකගෙන් ලැබුණුමුදල රු. 22000යි
අඩුකළ වට්ටම රු. 3000 යි

6.10 රන්දිකගෙන් රු. 40000 ක ණය ලැබීමේදී අඩුකළ වට්ටම 5% කි

6.12 මිතුන්ට ගෙවූ මුදල රු. 18000 යි
අඩුකළ වට්ටම රු. 2000 යි

6.15 සිතුම්ට රු. 20000 ක ණය ගෙවීමේදී අඩුකළ වට්ටම 5% කි.

ඉහත ගනුදෙනු මුදල් පොතේ සටහන් කර ලෙජරයේ වට්ටම් ගිණුම් පෙන්වන්න (ලකුණු 05යි)

(III) රවීන්ද්‍රගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසය සඳහා පිළියෙළ කළ සුළු මුදල් පොත පහත දැක්වේ.

සුළු මුදල් පොත

| ලැබීම් | ස. පි. | දිනය | විස්තරය | ව. අ. | ගෙවීම් | විශ්ලේෂණ තීරු | | | ලෙජර් ගිණුම | ලෙ. පි. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | තැපැල් වියදම් | ගමන් වියදම් | සංග්‍රහ වියදම් | | |
| 200 | | 1/1 | ශේෂය | | | | | | | |
| 1800 | | 1/1 | මුදල් | | | | | | | |
| | | 1/4 | තැපැල් ගාස්තු | 1 | 100 | 100 | | | | |
| | | 1/6 | ගමන් ගාස්තු | 2 | 200 | | 200 | | | |
| | | 1/8 | සංග්‍රහ වියදම් | 3 | 400 | | | 400 | | |
| | | 1/10 | මුද්දර | 4 | 150 | 150 | | | | |
| | | 1/12 | ගමන් වියදම් | 5 | 100 | | 100 | | | |
| | | 1/18 | රොමේෂ් | 6 | 500 | | | | 500 | |
| | | 1/20 | ත්‍රීරෝද රථ ගාස්තු | 7 | 300 | | 300 | | | |
| | | | | | 1750 | 250 | 600 | 400 | 500 | |
| | | 1/31 | ශේෂය ප/ගෙ | | 250 | | | | | |
| 2000 | | | | | 2000 | | | | | |
| 250 | | 2/1 | ශේෂය ඉ/ගෙ | | | | | | | |

අවශ්‍ය වන්නේ,

(අ) මෙම ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම

(ආ) 2020.02.01 දිනට ප්‍රතිපූරණය කළ යුතු මුදල

(ඉ) ඉහත සුළු මුදල් ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීම (ලකුණු 05)

(මුළු ලකුණු 12යි)